# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2497/36 - 2026 ජූලි මස 15 වැනි බදාදා - 2026.07.15**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ලියාපදිංචි අංක පී.වී. 115017 දරන සහ අංක 495, මීනුවන්ගොඩ පාර, බෝලවලාන, මීගමුව යන ලිපිනයෙහි පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2025 මැයි මස 28 දින අංක 2438/26 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "උපදේශන මනෝ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙළින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල් .කියු. එෆ්. 6 වන ස්ථරයේ) පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් ;

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව විෂය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණය විෂය ධාරාවෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ

1A - PG 7808 - 283 (2026/07)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇදුනු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කිරීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් (සී) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (එස්) සහිතව කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් (සී) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

යන අවම ඇතුළත්කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

3. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ආයතනය මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය සඳහා, මෙම නියමය පළ කරන ලද දිනයේ සිට වසරක් ඇතුළත සිසුන් ඇතුළත් කර ගත යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (පරිගණක විද්‍යාව) |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2026 ජූලි මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0198